බන්ධනාගාර කොමසාරිස් ජනරාල් චක්‍රලේඛ :- 16/2012

කේ.04/ආරක්ෂක / /2012,
බන්ධනාගාර මුලස්ථානය,
කොළඹ 09.
2012.06.20 වන දින.

**සියළුම ආයතනභාර බන්ධනාගාර අධිකාරීන් සහ**
**සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,**

**<u>බන්ධනාගාර ආයතන වල දෛනික ආරක්ෂක තත්වයන් වාර්තා කිරීම.</u>**

2012.06.21 වන දින සිට බන්ධනාගාර ආඥා පනතේ 16 - බී වගන්තිය හා බන්ධනාගාර ව්‍යවස්ථාපිත අණ පනත් හා 26 වගන්ති ප්‍රකාරව දෛනිකව ඔබ ආයතනයේ පසුගිය පැය විසිහතරක (24) කාලය තුල ආරක්ෂක තත්වය පිළිබඳව යම් සිද්ධියක් සිදුවුවහොත් ඒ පිළිබඳ වාර්තාවක් ඔබගේ අත්සනින් යුතුව මා වෙත එවීමට, ඔබ පුද්ගලිකව වගබලා ගත යුතු අතර, එම වාර්තාව පෙරවරු 07.00 වන විට බන්ධනාගාර මුලස්ථානය වෙත ෆැක්ස් මහින් එවීමට කටයුතු කල යුතුය. එයට අමතරව යම් වැදගත් සිද්ධියක් සිදුවෙමින් පවතිනවා නම් හෝ එසේ සිද්ධියක් සිදුවීමට ඉඩ ඇති බවට ඔබට තොරතුරක් ලැබී තිබේ නම් ඒ පිළිබඳව වහාම මා දැනුවත් කිරීමට ඔබ පෞද්ගලිකව වගබලා ගත යුතුය. යම් සිද්ධියක් සිදුවී එය නියමිත වේලාවට දැන්වීමට අපොහොසත් වුවහොත් එය ඔබගේ වගකීම් පැහැර හැරීමක් ලෙස සලකා කටයුතු කරන බව මෙයින් දන්වා සිටිමි.

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.